**පන්විල ප්‍රාදේශීය සභාව - 2020**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

පන්විල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල බිල් පොත් සැකසීම සඳහා ගෙවිය යුතු රු.27,450 ක් විවිධ ණයහිමි වටිනාකම තුළ ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | භාගලවත්ත ප්‍රජා ශාලාව දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ රු.240,143 ක් වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් ඉඩම් හා ගොඩනැගිලි වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | කර්මාන්ත ණයහිමියන් රු.190,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.7 අනුකූල නොවීම්**

---------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 126 (vii) ඊ හා (xxx) උප වගන්ති | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරුවලින් අයකළ යුතුව තිබූ රු.303,208 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට පවතිතන රු.303,208 ක මුදලින් රු.122,071 ක මුදලක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබාදී ඇති අතර ඉතිරි රු.181,136 ක හිඟ මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii)149 වගන්තිය | පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ අනුමත සංචාරක බංගලාවක් විසින් 2015, 2016, 2017, 2018 වර්ෂවලදී බදු ගෙවීම සඳහා සාවද්‍ය ලෙස ගිණුම් ප්‍රකාශයන් සකස් කර තිබුණි. | විගණනයෙන් හා පළාත් පාලන විමර්ශන වාර්තා මඟින් පෙන්වා දී ඇති කරුණුද සලකා මේ පිළිබඳව කරුණු දක්වන ලෙස අදාළ ආයතනය දැනුවත් කිරීමට කටයුතු කරමි. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 1996 අගෝස්තු 06 දිනැති අංක 935/06 දරන ගැසට් පත්‍රයේ 22 වන වගන්තිය | සභාබල ප්‍රදේශය තුළදී ඉඩම් කැබලි වෙන්දේසි කිරීමේදී මුළු ඉඩමින් සියයට 10 ක ප්‍රමාණයක් සභාවට වෙන්කර පවරාදීම සිදුකළ යුතු වුවත් පල්ලේබැද්ද ඉඩමෙන් පර්චස් 399 ක් වෙන්දේසි කිරීමේදී ලබාදිය යුතුව තිබූ පර්චස් 40 ක් ආසන්න ප්‍රමාණය වෙනුවට පර්චස් 28 ක් පමණක් ලබාදී තිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,491,664 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,838,528 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු වටිනාකම රු.780,768 ක් වූ අතර, ඒ තුළ වර්ෂ 1 ත් - 5 ත් අතර හිඟ වරිපනම් රු.606,305 ක්ද වර්ෂ 5 ට වැඩි රු.89,208 ක් ද පැවතියත් එම මුදල් අයකර ගැනීමේ කටයුතු දුර්වල මට්ටමක පැවතුණි. | හිඟ මුදල් අය කර ගැනීමට ඉදිරි කටයුතු සැලසුම් කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **කඩ කුලී** | | |
| | 2016 අගෝස්තු 23 දිනැති තක්සේරුව 2019 ජනවාරි මස ක්‍රියාත්මක කළ පසු කිසිදු කඩ හිමියකු 2020 දෙසැම්බර් 31 දින දක්වා කඩ කුලී ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු.2,278,000 ක හිඟයක් පැවතුණි. | මේ වන විට නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය සියලු කටයුතු ආරම්භ කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තුරු.708,020 ක් විය. | ජංගම සේවා පවත්වා අය කිරීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ හිටි ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු ශේෂය රු.402,500 ක් හා වර්ෂයේ බිල් කිරීම් රු.180,000 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂයේ අයකර තිබුණේ පිළිවෙලින් රු.61,425 ක් හා රු.114,400 ක් පමණි. | 2020 දෙසැම්බර් 31 දිනට පවතින හිඟයෙන් මේවන විට රු.3,900 ක මුදලක් අයවී ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | පෙර වර්ෂයේ සිට පැවත එන ත්‍රීරෝද රථ ගාස්තු පුද්ගලයින් 104 දෙනෙකුගෙන් රු.421,675 ක හිඟයක් පවතින අතර හිඟ අයකර ගැනීම සඳහා පුද්ගලයින් 24 දෙනෙකුට පමණක් නඩු පවරා තිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා නඩු පැවරීමට පෙර හිඟ ගෙවන ලෙස දැනුවත් කිරීමේ ලිපි යැවීමට කටයුතු කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | පෙර වර්ෂයේ සිට පැවත එන රු.280,199 ක ප්‍රචාරණ ගාස්තු හිඟයෙන් වර්ෂය තුළදී රු.10,360 ක් හෙවත් සියයට 3.7 පමණක් හිඟ ආදායම් ලෙස රැස්කර ගෙන තිබුණි. | හිඟ ශේෂයෙන් රු.122,071 ක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කපා හැර ඇති අතර ඉතිරි මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුද්දර ගාස්තු ශේෂයෙහි එකතු වටිනාකම වූ රු.3,444,790 ක් තුළ වසර 1 සිට වසර 5 දක්වා කාලයට අදාළ රු.402,840 කගිණුම් ශේෂ ඇතුළත්ව තිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,953,002 ක් වනගෙවිය යුතු ගිණුම්වලට අදාළ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.2,333,859 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.2,619,143 ක් වී තිබුණි. | ඉදිරියේදී ගෙවා නිම කිරීමට කටයුතු කරමි. | නොපමාව පියවීමට කටයුතු කළ යුතු වීම. |

3.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නකල්ස් බඹරැල්ල සංචාරක නිකේතනය හා හුළුගඟ නැරඹුම් මැදිරිය ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.4,404,748 ක් හා රු.11,184,177 ක් වියදම් දරා තිබුණද සියයට 8.5 ක හා සියයට 5.5 ක ආදායම් පමණක් උපයා තිබුණි. | නකල්ස් පොදු පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමටත් හුළුගඟ දිය ඇල්ල නැරඹුම් මැදිරිය සහිත ගොඩනැගිල්ලේ බිම් මහල මහජන බැංකුව වෙත ලබා දීමට තක්සේරුවට යවා ඇත. | වත්කම්වලින් ලබා ගත හැකි ආදායම් ලබා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. |
| (ආ) | හුළුගඟ සතිපොළ සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද රු.1,500,000 ක වියදමින් ඉකුත් වර්ෂයේ සිට කිසිදු ආදායමක් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | 2020 වසරේ කොවිඩ් වසංගත තත්ත්වය යටතේ පොළ පැවැත්වීම තහනම් කර තිබුණි. | පවත්නා තත්ත්වය නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් උපයාගත හැකි ආදායම උපයා ගැනීමට කටයුතු කළ යුතු වීම. |